# ඔබේ නැව යාත්‍රා කරන්නේ කොහාටද ?



# ඔබේ නැව යාත්‍රා කරන්නේ කොහාටද ?

දිනක්, නැවක කප්පිත්තෙක් මුහුදු යාත්‍රාකරන නාවිකයින් සමුහයකට කතා කරමින්, "මා අවුරුදු 40 ක්ම මුහුදේ නැව්වල යාත්‍රාකරමින් සේවය කර තිබෙනවා. ඒ කාලය තුලදී, යම් නියම ස්ථානයක් කරා යාත්‍රා නොකරන නැවක් මට කිසි දිනයක් හමුවී නෑ" යයි කීය. එවිට," යම් ස්ථානයක් කරා යාත්‍රා නොකරන නැවක් තිබේදැයි? "සිතමින් ඔවුන් කවුරුත් කප්පිත්තාගේ මෝඩ කියමනට සිනාසුනා. එහෙත්, ඒ මෝඩ කියමන තුළින් මනුෂ්‍යයාගේ ආත්මය පිළිබඳව මහත් සත්‍යයක් ඔහු එළිදරව් කළ විට, ඒ නාවිකයෝ පුදුම වුනා.

"මගේ ජිවිතය නමැති මුහුදු ගමනේදී යම් නියම ස්ථානයක් කරා ගමන් නොකරන, ඔබ හා මා වාගේ මනුෂ්‍යය නැවක් මට කිසි විටෙක හමුවෙලා නෑ. එහෙත් ඔබ ගමන් කරන්නේ මොන වරායට දැයි? ඔවුන්ගෙන් විමසු විට, තමන් යන්නාවු නියම ස්ථානයක් ගැන ස්ථිර වශයෙන් කියන්ට ඔවුන්ගෙන් සමහරෙකුට බැරි වුනා. එහෙත් ඔව්හු ස්වර්ගයට යයි කියා බලාපොරොත්තුවෙන් ඔවුන් සිටියා යයි ඒ කප්පිත්තා අනික් නාවිකයින්ට විස්තර කලා. ඔව් ප්‍රිය පාඨකය ඔබ මේ ගැන මොහොතක් සිතා බලන්න. ඔබට මේ ප්‍රශ්නය





බලපාන්නේ කොහොමද? ඔබ ගමන් කරන්නේ මොන වරායටද? ඔබ "කාලය" නමැති මුහුදේ ඉදිරියට ගමන් කරන බව සැබෑය. ගතවන සෑම දවසක්ම, ඔබ යන මුහුද ගමනේ කෙළවරට ඔබව ළඟා කරයි. "ඔබේ ජීවිතය" නමැති ගමන අද කෙළවරවන්ට පුළුවන්. ඒ ගැන කියන්න පුළුවන් කාටද? "හෙට ගැන පාරට්ටු නොකරන්න. මොකද, දවසක් ඇතුළතදී මොනවා සිදු වේදැයි ඔබ නොදන්නෙහිය" (හිතෝපදේශ 27:1) සංඛ්‍යා ලේඛණ අනුව, සෑම දවසකදීම 90,000 ක් හෝ ඊට වැඩි ගණනක් මනුෂ්‍යයන් මැරී, මෙලොව හැරදමා සදාකාලයට ඇතුල් වන පිණිස කැඳවනු බව පෙනී යයි. එසේ මරණය තුළින් කැඳවනු ලබන මීළඟ තැනැත්තා, ඔබ විය හැක. එසේ වුවොත් ඔබට සිදු වන්නේ මොකක්ද?

කිසිදක විනාශ නොවන, ඔබේ නොමැරෙණ ආත්මය ඇතුල්වෙන්නේ මොන වරායටද? ස්වර්ගයටද, නැත්නම් නිරයටද? සදාකාලය නමැති වෙරළෙහි තිබෙන්නේ වරායන් දෙකක් පමණී. ඉන් එක් වරායකට ඔබ ඇතුළු විය යුතුමය. දැනට ඔබ යාත්‍රාකරමින් සිටින්නේ ඉන් මොන වරාය දෙසටද? ඔබේ ජීවිත ගමන කෙළවර වන ස්ථානය ගැන ඔබට ස්ථිර සහතිකයක් තිබෙනවාද? එසේ නැත්නම්, "කාලය" නමැති මුහුද පිට ඔබ මොබ



පාවෙමින්, ලෝකය වෙතින් හමා එන සැප සම්පත් නමැති චණ්ඩ මාරුතයන් තුළින්, ඔබ නිරය දෙසටම ඇදී යමින් සිටිනවාද?

ප්‍රිය මිතුර, ඔබේ නැවට මග පෙන්වන පිණිස ඔබට මාර්ගෝපදේශකයෙක් අවශ්‍ය වේ. එසේ ඔබේ "ජීවිතය" නමැති ගමනට මග පෙන්වමින්, "ස්වර්ගය" නමැති වරායට ඔබට සුරක්ෂිත ලෙස ගෙනයා හැකි එකම මාර්ගෝපදේශකයා ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ බව ඔබට කිව යුතුය. "මාර්ගයද, සත්‍යද ජීවිතයද මමය. මා කරණකොටගෙන මිස කව්රුත් පියාණන් වහන්සේ වෙනට පැමිණෙන්නේ නැත "(යොහන් 14:6). යයි උන්වහන්සේ ප්‍රකාශ කරන්සේක.

උන්වහන්සේ ඔබට මග පෙන්වන මාර්ගෝපදේශකයෙක් පමණක් නොව. උන්වහන්සේ මාර්ගයද වේ. ඔබ වෙනුවෙන් උන්වහන්සේ කල්වරි කුරුසිය පිට මැරී, ඔබේ පව් කමාකරන පිණිස රුධිරය වැගුරූ සේක.

කිසිම පාපයකට ස්වර්ගයට ඇතුළුවිය නොහැකි බව ඔබ දන්නවා මනුෂ්‍යයින්ට ස්වර්ගයට ඇතුළුවීමට බාධාකරන්නේ පාපයයි. ඔබ පව්කාරයෙක්. මොකද, "සියල්ලෝම පව් කර තිබේ" (රෝම 3:23 යනුවෙන් දේව

වචනය පවසනවා. එහෙත්, ක්‍රිස්තුස්වහන්සේ පව්කාරයින් වෙනුවෙන් මැරුණා. උන්වහන්සේ අප වෙනුවෙන් පාපය වුනා (රෝම 5:8, 2 කොරින්ති 5:21) එහෙයින් පව්කාරයින්ට ස්වර්ගයට යන්ට තිබෙන මාර්ගය සහ එකම මාර්ගය උන්වහන්සේ වෙනවා. උන්වහන්සේ ඉදිරියේ තමන් වරදට පත් පව්කාරයන් ලෙස තමන්ගේ පව්වෙනුවෙන් මැරුණු තමන්ගේ ගැළවුම්කාරයා ලෙස උත්වහන්සේව ඇදහිල්ලෙන් පිළිගන්නා සෑම කෙනෙකුටම පාප කමාවක්, සදාකාල ජීවනයක් ලැබෙන අතර, ඔව්හු ස්වර්ගය වෙතට ගමන් ගන්නා අයවළුත් වෙනවා. "අප උදෙසා කැප කළාවූ මාර්ගය වන අලුත්වූ ජීවමාන මාර්ගයකින්, උන්වහන්සේගේ ලේ කරණකොටගෙන, ශුද්ධ ස්ථානයට ඇතුල්වීමට අපට නිදහස තිබේ" (හෙබ්‍රෙව් 10:19,20) "කාලය" නැමති මුහුදේ ඔබ මොබ පාවෙමින් සිටින හෝ කුණාටුවලට අහුවී ඔබ මොබ වෙමින් පාපය කරණ කොටගෙන නැතිවී සිටින ඔබත් මාත් වැනි අසරණ පව්කාරයින් වෙනුවෙන් දෙවියන්වහන්සේ සපයා දෙන ඒ පුදුම මාර්ගෝපදේශකයා යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. මේ ගැළවුම්කාරයාව ඔබේ මාර්ගෝපදේශකයා ලෙස ඔබේ ජීවිතය නමැති නැවට ඔබ කැඳවාගෙන තිබෙනවාද? එසේ නැත්නම්, මේ මොහොතේව, ඔබේ ස්වාමින් හා ගැළවුම්කරු ලෙස පිළිගන්න. මෙන්න දැන්



පිළිගත යුතුවූ කාලයයි. මෙන්න දැන් ගැළවීමේ දවසයි" (12 කොරින්ති 6:2).

"මෙන්න, මම දෙර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මගේ හඬ අසා දොර ඇරියොත්, ඔහු වෙතට ඇතුල් වී, ඔහු සමඟ කෑම කන්නෙමි." (එළිදරව් 3:20) යයි යේසුස් වහන්සේ ඔබට කියනවා. ඔබේ සිතට ඇතුල්වී ඔබේ මාර්ගෝපදේශකයා වීමට උන්වහන්සේ කැමතියි. ඔබේ සිත නමැති දෙරට තට්ටු කරමින්, ඔබේ සිතට ඇතුල්වන්නට සොයමින් උන්වහන්සේ සිටිනවා. ඔබ උන්වහන්සේට ඇතුල්වන්නට ඉඩ නොදෙන්නෙහිද? උන්වහන්සේට ඇතුල්වීමට ඉඩ දෙන්න. එවිට ඔබ ස්වර්ගය නමැති වරාය කරා යන බව ඒකාන්තය. මොකද, මම ඔවුන්ට සදාකාල ජීවිතය දෙමි. ඔව්හු කවදවත් විනාශ නොවන්නේ" යයි උන්වහන්සේ කියනවා. (යොහන් 10:28)

තවද, "උන්වහන්සේ කෙරෙහි අදහාගන්නා සෑමදෙනාම විනාශ නොවී, සදාකාල ජීවනය ලබාගන්නේය" (යොහන් 3:16)